www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

## සසප-සසජාශි අනුස්මරන රැස්වීමක්

# ශ්‍රී ලංකා ට්‍රොට්ස්කිවාදී නායක කීර්ති බාලසූරියගේ අභාවයෙන් විසි වසරක්

## SEP-ISSE memorial meeting
## Twenty years since the death of Sri Lankan Trotskyist leader Keerthi Balasuriya

**2007 දෙසැම්බර් 5**

ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂය (සසප) සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) කීර්ති බාලසූරියගේ අභාවයේ 20 වන සංවත්සරය සමරනු වස් දෙසැම්බර් 23 දා කොලඹ දී ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු ඇත.

කීර්ති සහෝදරයා සසප පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ (විකොස) ප්‍රධාන ලේකම් මෙන් ම හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ නායකයෙක් විය. යන්තම් 39 වන වියට එළඹ සිටිය දී 1987 දෙසැම්බර් 18 දා සිදු වූ ඔහුගේ අකල් මරනය, පශ්චාත් දෙවන ලෝක යුද කාල පරිච්ජේදයේ සිය අගනාම නියෝජිතයකු ලෝක ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයට අහිමි කලේ ය.

සුවිශේෂ බුද්ධිමතෙකු හා නිපුන කලාකරුවකු වූ කීර්ති 16 වන වියෙහි සිට සිය සමස්ත වැඩිහිටි ජීවිතය ම කැප කලේ හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ගොඩනැඟීමට යි. 1968 දී විකොස පිහිටුවන අවස්ථාවේ දී, යන්තම් 19 වන වියෙහි සිටි ඔහු එහි නායකත්වය භාර ගැනීම මාක්ස්වාදයේ න්‍යායික පදනම් ඔහු විසින් දැඩිව උකහා ගනු ලැබීමේ ප්‍රකාශනයකි. ට්‍රොට්ස්කිවාදය සඳහා වූ ඔහුගේ ජීවිත කාලීන අරගලය, විප්ලවවාදී දේශපාලනය දෙසට හැරෙමින් සිටින වත්මන් තරුන පරම්පරාවට දැවැන්ත වැදගත්කමක් දරයි.

කීර්ති දේශපාලන ජීවිතයට ඇතුලු වූයේ ප්‍රමුඛ ට්‍රොට්ස්කිවාදී පක්ෂ දෙකක පාවාදීම් මගින් නිර්මානය කෙරුනු අති මහත් දුෂ්කරතා මධ්‍යයේ ය. එනම්, එක්සත් ජනපදයේ සමාජවාදී කම්කරු පක්ෂය 1963 දී අවස්ථාවාදී එක්සත් ලේකම් මන්ඩලය සමග යලි එකමුතුවීම සහ ශ්‍රී ලංකාවේ ලංකා සමසමාජ පක්ෂය (ලසසප) 1964 දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකත්වයෙන් යුක්ත ධනේශ්වර ආන්ඩුවකට ඇතුලු වීම යි.

මෙම මහා පාවාදීම් පැහැදිලි කිරීමට ගෙන ගිය උත්සාහයේ දී, කීර්ති මාඕ සේතුං, හෝ චි මිං හා චේ ගුවේරා වැනි ධනේශ්වර ජාතිකවාදී ව්‍යාපාර හා පුද්ගලයන් වැලඳ ගැනීමේ පුලුල්ව පැතිරුනු මනෝගතියට එරෙහිව දැඩිව සිට ගත්තේ ය. ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යාය මත පාදක වූ කීර්ති කම්කරු පන්තිය පමනක් ම සමාජයේ එක ම ස්ථිරසාර විප්ලවවාදී බලවේගය වන බව අවධාරනය කරමින්, ධනේශ්වරයෙන් හා එහි සියලු දේශපාලන ඒජන්සිවලින් කම්කරු පන්තිය ස්වාධීන කර ගැනීම සඳහා නොසැලී සටන් වැදුනේ ය.

චීනය, වියට්නාමය හා කියුබාව ජාත්‍යන්තර මූල්‍ය ප්‍රාග්ධනය සඳහා වූ ලාභ ශ්‍රම වේදිකා බවට පරිවර්තනය වීම කීර්තිගේ දුරදක්නා භාවය අවධාරනය කරයි. ඔහුගේ ජීවිතය හා වැඩකටයුතු ශ්‍රී ලංකාවේ පමනක් නොව, ආසියාව පුරා හා ජාත්‍යන්තර පරිමානව කම්කරුවන් හා තරුනයන් සඳහා ක්ෂනික අදාලත්වයක් දරයි. ලෝක සමාජවාදී විප්ලවය සඳහා අරගලයට කීර්ති කල දේශපාලන හා න්‍යායික ප්‍රතිපදානයන්ගේ ඓතිහාසික අර්ථභාරය සමාලෝචනයට භාජනය කරන අපගේ අනුස්මරන රැස්වීමට පැමිනෙන ලෙස අපගේ ආධාරකරුවන්ට හා ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පාඨකයන්ට සසප ආරාධනා කර සිටී.

**වේලාව: දෙසැම්බර් 23 වන ඉරිදා සවස 3.00**

**ස්ථානය: මහවැලි කේන්ද්‍රය, ග්‍රීන් පාත්, කොලඹ 7.**

© www.wsws.org